මගේ අංකය: ජේඑස්සී/රිජ්/ස්ථානමාරු - 2027

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්,
දිසා විනිසුරුවරුන්/ මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත,

**<u>උපලේඛනගත රජයේ නිලධාරීන්ගේ/ අධිකරණ වල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ (වැඩසටහන් සහකාර සහ ගිණුම් සහකාර නිලධාරීන් ඇතුළු) වාර්ෂික ස්ථානමාරු අයදුම්පත් කැඳවීම - 2027</u>**

2026.12.31 දිනට වර්තමාන සේවා ස්ථානයේ වසර හතරක් (04 ක්) හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ලද ඔබ අධිකරණයේ සේවයේ නියුතු සියලුම උපලේඛනගත රජයේ නිලධාරීන් සහ සංවර්ධන නිලධාරී, වැඩසටහන් සහකාර, ගිණුම් සහකාර තනතුරුවල නිලධාරීන් සඳහා 2027 වර්ෂයේ ස්ථානමාරු අයදුම්පත් කැඳවීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

02. ඒ අනුව අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ නිල වෙබ් අඩවියේ පළ කර ඇති "Specimen Form - A" දී ඇති උපදෙස් අනුව නිවැරදිව සම්පූර්ණ කර පහත සඳහන් විද්‍යුත් ලිපින වෙත **මෘදුපිටපත්** (Soft Copies) **<u>2026.08.07 දින හෝ ඊට පෙර</u>** ඊමේල් කර එවිය යුතුය.

03. එහි දෘඩ පිටපත් (Hard Copies) **<u>2026.08.12 දින හෝ ඊට පෙර</u>** "ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ - 12" යන ලිපිනයට එවිය යුතුය. ආකෘතිපත්‍ර බහාලන කවරයේ ඉහල වම් කෙලවරෙහි " **<u>පිරිස් පාලන අංශය - වාර්ෂික ස්ථාන මාරු - 2027</u>** " වශයෙන් සඳහන් කල යුතුය.

04. එසේ අයදුම්පත් එවීමේදී ආවරණ ලිපිය සමඟ අයදුම්පත් එවනු ලබන නිලධාරීන්ගේ නාමලේඛනයක් (ඇමුණුම - 02) සහ 2026.12.31 දිනට ඔබ අධිකරණයේ වසර 04ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන නිලධාරීන්ගේ නාම ලේඛනයක් (ඇමුණුම - 03) එවිය යුතුය.

| **අනු අංකය** | **තනතුර** | **MS Word ලිපි ගොනුව නම් කළ යුතු ආකාරය** | **එවිය යුතු විද්‍යුත් ලිපින** |
|---|---|---|---|
| 1. | අධිකරණ රෙජිස්ට්‍රාර් | උදා:- Regi – HC Colombo | regi.antr@jsc.gov.lk |
| 2. | අධිකරණ පවුල් උපදේශක | උදා:- FC – HC Colombo | fc.antr@jsc.gov.lk |
| 3. | සංවර්ධන නිලධාරී | උදා:- DO – HC Colombo | do.antr@jsc.gov.lk |
| 4. | අධිකරණ ලිපිකරු | උදා:- Clerk – HC Colombo | clerk.antr@jsc.gov.lk |
| 5. | අධිකරණ භාෂණ පරිවර්තක | උදා:- Inter – HC Colombo | inter.antr@jsc.gov.lk |
| 6. | අධිකරණ ලඝු ලේඛක | උදා:- Steno – HC Colombo | steno.antr@jsc.gov.lk |
| 7. | අධිකරණ යතුරු ලේඛක | උදා:- Typist – HC Colombo | typist.antr@jsc.gov.lk |
| 8. | අධිකරණ පොත් බැඳුම්කරු | උදා:- Binder – HC Colombo | binder.antr@jsc.gov.lk |

05. දැනට වෙනත් අධිකරණ වෙත තාවකාලිකව අනුයුක්ත කරනු ලැබ සිටින නිලධාරීන් **<u>ස්වකීය ස්ථිර සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් පමණක්</u>** ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

06. ස්ථානමාරු ඉල්ලා සිටීමේ දී නිලධාරීන් විසින් තම කැමැත්ත අනුව අනිවාර්යෙන්ම ස්ථාන පහක් (05ක්) පහත දැක්වෙන පරිදි නම් කල යුතු අතර වර්තමාන සේවා ස්ථානය පිහිටි අධිකරණ සංකීර්ණයේ වෙනත් අධිකරණයන් නම් නොකළ යුතුය. තම කලත්‍රයා හෝ ආසන්න ඥාතියෙක් දැනට අධිකරණවල සේවයේ නියුතුව හෝ නීතිඥ වෘත්තියේ යෙදී සිටී නම් එවැනි කිසිඳු නිලධාරියෙකු කලත්‍රයා හෝ ආසන්න ඥාතියා සේවය කරන අධිකරණයටම හෝ නීතිඥ වෘත්තියේ යෙදී සිටින අධිකරණයට ස්ථාන මාරුවීම් ඉල්ලා නොසිටීමට වගබලා ගත යුතුය.

**<u>අයදුම් කළයුතු ආකාරය පිළිබඳ උදාහරණ</u> :-**

**<u>ගාල්ල මහාධිකරණයේ සේවයේ නියුතු නිලධාරියෙකුගේ තේරීම්</u>:**

1. උඩුගම දිසා/ මහේස්ත්‍රාත් අධිකරණය
2. මාතර අධිකරණ සංකීර්ණයේ අධිකරණයක්
3. ඇල්පිටිය අධිකරණ සංකීර්ණයේ අධිකරණයක්
4. බද්දේගම දිසා/ මහේස්ත්‍රාත් අධිකරණය
5. බලපිටිය අධිකරණ සංකීර්ණයේ අධිකරණයක්

07. ස්වකීය සේවා ස්ථානයේ වර්ෂ හතරක් (04 ක්) හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නමුත් ස්ථානමාරු <u>අයදුම්පත් ඉදිරිපත් කරනු නොලබන නිලධාරීන්</u> සේවා අවශ්‍යතා මත පුරප්පාඩු පවතින අධිකරණවලට අනිවාර්යයෙන්ම ස්ථාන මාරු කරන අතර එවැනි නිලධාරීන් පසුව ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බලනු නොලබන බව අවධාරණය කෙරේ.

08. ඒ අනුව ඉහත 06හි සඳහන් විධිවිධානයන්ට පටහැනිව ස්ථානමාරු අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන නිලධාරීන් විෂයෙහි ද ඉහත 07හි සඳහන් පරිදි කටයුතු කරනු ලැබිය හැකි බව මෙයින් අවධාරණය කරනු ලැබේ.

09. තව ද ස්වකීය සේවා ස්ථානයේ වර්ෂ 04ක සේවා කාලයක් සම්පූර්ණ නොවූවද බරපතල රෝගී තත්ත්වයන් හා සුවිශේෂී අපහසුතා ඇති නිලධාරීන්ට ද වාර්ෂික ස්ථානමාරු අයදුම්පත් යොමු කිරීමට අවස්ථාව ලබාදීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.


10. මෙම ලිපියේ උපදෙස් ප්‍රකාරව ස්ථාන මාරු අයදුම් කිරීමට නිලධාරීන් වගබලා ගත යුතු අතර ඔවුන් විසින් ඉල්ලා සිටිනු ලබන සේවා ස්ථාන ලබාදීමට නොහැකි වන අවස්ථාවන්හි සේවා අවශ්‍යතාවය මත අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නියමිත සේවා ස්ථානයක් ලබා දෙනු ඇත.

11. 2027 වාර්ෂික ස්ථානමාරු සලකා බැලීමේ දී ද පෙර වර්ෂවල ක්‍රියාත්මක කරන ලද පරිදි දකුණු පළාතේ සේවයේ නියුතු අධිකරණ ලඝු ලේඛක නිලධාරීන් සඳහා සේවා අවශ්‍යතාවය මත දකුණු පළාතෙන් පරිබාහිර සේවා ස්ථාන වෙත ස්ථාන මාරු ලබා දීමට සිදු විය හැක.

12. <u>**ස්ථාන මාරු ලබාදීමේ පිළිවෙල**</u>

නව බඳවාගැනීම් මඟින් මානව සම්පත් කළමනාකරණය කරමින් අධිකරණ කටයුතු පවත්වාගෙන යාමට ප්‍රමුඛතාවය ලබාදෙමින් හැකිතාක් දුරට නිලධාරීන්ගේ ඉල්ලීම් ද ඉටු කිරීමට හැකි වැඩ පිළිවෙලක් සලකා බලනු ලැබේ.

13. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් බාර ගනු නොලැබේ.




2026 ජූලි මස 23 වෙනි දින,
කොළඹ -12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.